ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

**කොළඹ**

## පුවත්පත් නිවේදනය

<u>ඉන්දිය පතල් නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ.</u>

ඉන්දිය රජයේ පතල් අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් යුත් නියෝජිත පිරිසක් පතල් සහ ඛනිජ ක්ෂේත්‍රයේ සහයෝගීතාවයන් සඳහා පවතින අවස්ථාවන් සොයා බැලීම සඳහා 2025 මැයි 20-22 දිනවල ශ්‍රී ලංකා සංචාරයක නිරත විය. මෙම නියෝජිත පිරිසට ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ රජයේ පතල් සමාගම් ඇතුළත් විය.

2. මෙම සංචාරය අතරතුරදී නියෝජිත පිරිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා හමු වූ අතර කහටගල ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්, ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්, භූ විද්‍යා සහ පතල් කාර්යාංශය සහ ලංකා ෆොස්ෆේට් ලිමිටඩ් ඇතුළු ශ්‍රී ලංකාවේ ඛනිජ ක්ෂේත්‍රයේ රජයට අයත් සමාගම් සහ ආයතනවල සභාපතිවරුන් ඇතුළු පිරිසක් සමඟ සාකච්ඡා පැවැත්වූහ. මෙම නියෝජිත පිරිස ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද හමු වූහ.

3. ආයෝජන සහ සහයෝගීතා අවස්ථා සොයා බැලීම, දියුණු පතල් තාක්ෂණ ක්ෂේත්‍රය තුළ තාක්ෂණ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සහ ඛනිජ ක්ෂේත්‍රයේ අගය එකතු කිරීම සඳහා ඒකාබද්ධ මූලපිරීම් පිළිබඳව සාකච්ඡා කිරීම මෙම සංචාරයේ අරමුණ විය.

4. මෙම සංචාරය 2025 පෙබරවාරි 15 වන දින නව දිල්ලියේදී ඛනිජ ක්ෂේත්‍රයේ සහයෝගීතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඉන්දිය රජයේ ගල්අඟුරු සහ පතල් රාජ්‍ය අමාත්‍ය සතිෂ් චන්ද්‍ර දූබේ මහතා සහ

ශ්‍රී ලංකා රජයේ කර්මාන්ත සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා අතර පැවති හමුව හා සම්බන්ධව සිදු විය. එම හමුවෙන් අනතුරුව 2025 මාර්තු 10 වන දින ඉන්දීය රජයේ පතල් අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ ශ්‍රී ලංකා රජයේ කර්මාන්ත සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමිය අතර අතථ්‍ය හමුවක් ද පැවැත්විණ.

5. ඉන්දීය නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ ප්‍රධාන පතල් සහ කැණීම් ස්ථාන වෙත ද ක්ෂේත්‍ර චාරිකාවන් හි නිරත වෙමින් මෙහෙයුම් ක්‍රියාවලීන් පිළිබඳව අවබෝධයක් ලබා ගත් අතර අනාගත සහයෝගීතාවයන් සඳහා අවස්ථා ද සොයා බැලූහ.

***

**කොළඹ**

***2025* මැයි *23***